ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

18+ යොවුන් ඉතුරුම් ගිණුම

නිමැවුමේ ස්වභාවය	ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම්	ප්‍රධාන නියම හා කොන්දේසි
තරුණ පරපුර වෙනුවෙන් වන ඉතුරුම් ගිණුම	• **පොලී අනුපාතය** සාමාන්‍ය ඉතුරුම් අනුපාතයට වඩා 0.5%ක් වැඩිය. නවතම පොලී අනුපාතය බලාගැනීමට https://www.boc.lk/rates-tariff#rupee-deposit-rates වෙත පිවිසෙන්න. • **වෛද්‍ය රක්ෂණාවරණය** හදිසි අනතුරක් හෝ කලින් හඳුනාගත් බරපතල රෝග 10ක් හේතුවෙන් රෝහල්ගතවීමකදී එක් වසරකට රු.100,000/-ක් දක්වා - හදවත් රෝග (By-Pass, ASD closure & VSD) - පිළිකා - වකුගඩු රෝග - ජැපනීස් එන්සෙපලයිටිස්/ මෙනින්ජයිටිස් - ඇස් ලෙඩ - ඇඳුම - ඇපෙන්ඩිසයිටිස් - කන ආශ්‍රිත රෝග - ඩෙංගු/ නියුමෝනියාව - ලියුකේමියාව • **ජීවිත/ පූර්ණ ආබාධිත රක්ෂණාවරණය** අනතුර හා ගිණුම් ශේෂය මත පදනම්ව රු.500,000 දක්වා • **අ.පො.ස. උසස් පෙළ විශිෂ්ට ලෙස සමත්වූවන්ට නැණජය ශිෂ්‍යත්ව** ඔහු හෝ ඇය පෙනීසිටින අ.පො.ස. උසස් පෙළ විභාගය ආරම්භ වන දින සිට ඉදිරියට අඛණ්ඩව මාස 6ක කාලයක් රු. 10,000/-ක අවම ශේෂයක් පවත්වාගෙන ගොස් එම වසරේදීම අ.පො.ස. උසස් පෙළ විභාගය විශිෂ්ට ලෙස සමත්වූවන්ට 18+ නැණජය ශිෂ්‍යත්ව අයදුම්කළ හැකිය. • **විවාහයේදී ත්‍යාග**: ගිණුම විවෘත කළ දිනය, ගිණුම් ශේෂය සහ ශේෂය පවත්වාගෙන ගිය කාල සීමාව මත පදනම්ව තෑගි වවුචර. • **පළමු දරුවාට රන්කැකුළු SMART ගිණුමක් නොමිලේ**: පළමු දරු උපතට පෙරාතුවම වූ මාස 12ක කාලය ඇතුළත රු.10,000/-ක් හෝ ඊට වැඩි මුදලක් පවත්වාගෙන යන ගිණුම් සඳහා	• **ආරම්භක තැන්පතුව** - රු.500/- • ගිණුමේ අවම මාසික ශේෂය රු.500/-ට වඩා අඩු වේ නම්, **මසකට රු.35** බැගින් අයකරනු ලැබේ. • **ගිණුම වසාදැමීමේ ගාස්තු - රු.500/-** • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** o ATM කාඩ්පත් නිකුතුව o බැංකු ප්‍රකාශ ලබාගැනීම o පාස්පොතේ අනු පිටපතක් නිකුත්කිරීම o ගිණුම් ශේෂයන් තහවුරු කිරීම o ස්ථාවර නියෝග ලියාපදිංචිය සහ මුදල් හුවමාරුකිරීම් o SMS Alerts ගාස්තු o ATM වෙතින් මුදල් ගැනීමේ සීමාව වෙනස්වීම o අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/ratestariff#general-tariff වෙත පිවිසෙන්න • **බදු -** පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• වයස අවු. 18-25ත් අතර වයස් කාණ්ඩයේ පසුවන ශ්‍රී ලංකාවේ නේවාසිකයන්ට මෙම ගිණුම විවෘත කළ හැකිය. • වයස අවු. 18+ සිට 35 වයස් කාණ්ඩයේ අය විසින් ගිණුම පවත්වාගෙන යා හැකිය. • තනි පුද්ගල ගිණුම් පමණක් විවෘත කළ හැකිය. බද්ධ ගිණුම්වලට අවසර නොලැබේ. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - ජාතික හැඳුනුම්පතේ (NIC)/ NIC අංකය දැක්වෙන වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්; - දැන් සිටින ලිපිනය හා NICහි සඳහන් ලිපිනය වෙනස් වේ නම්, ලිපිනය තහවුරුකිරීමේ ලේඛන; - ගිණුම විවෘත කරන බැංකු ශාඛාවට අයදුම්පතේ දී ඇති ස්ථිර ලිපිනය දුරින් පිහිටා තිබේ නම් ඒ සඳහා වලංගු හේතුවක් ද සමග, • 18+ ඉතිරිකිරීමේ ගිණුමක් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	- ගිණුමෙන් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ ලබාගැනීම සඳහා (උදා: රක්ෂණය, ත්‍යාග, ශිෂ්‍යත්ව වැනි) ගිණුම්හිමියා විසින් ගිණුම් ශේෂය/තැන්පතුව, තැන්පතු කාලය, වයස් සීමාව වැනි කලින් කලට බැංකුව විසින් තීරණය කරනු ලබන නියමිත නිර්ණායක සපුරාලිය යුතුවේ. - සියලුම ප්‍රතිලාභ වයස අවු. 35 වනතෙක් භුක්තිවිඳිය හැකි අතර ඉන්පසු ගිණුම්හිමියා ශාඛාව වෙත පැමිණෙන තෙක් එය සාමාන්‍ය ඉතුරුම් පොලී අනුපාතය යටතේ සමාන්‍ය ඉතුරුම් ගිණුමක් ලෙස හරවනු ලැබේ. - නිමැවුමට අදාළ සියලුම නියම හා කොන්දේසි දැනගැනීම සඳහා ගිණුම විවෘතකිරීමේ අයදුම්පත බලන්න.

Classification: Internal

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අනපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- එක් තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
  අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිඳු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk
- තැපෑල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල, ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.

අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.

Classification: Internal